කෙටි කථාවක්.

# උපාධිධරයෝ

> ඉංග්‍රීසිය ඉංග්‍රීසිය මෙන්ද, සිංහලය සිංහලය මෙන්ද උගත් උපාධිධර ගැමි තරුණයෙකු- ගොවියෙකු වශයෙන් සිය ජීවිතය සාර්ථක කරගත් සැටිත්- ජීවිතයේ නියම ලොව්තුරා රසය ලබාගත් සැටිත් විදහා දක්වන මේ කතාකරුවා ගමේම ඉපැදුනු- ගමේම වැඩුනු- ගමේම හැදුන ගොවි දරුවෙකි. හැම රැකියාවකටම වඩා "ගොවිකම" උසස් බව දක්වීමට ඔහු ගන්නා තැත සාර්ථක වීදැයි නිගමනය කිරීම පාඨකයා සතු කාර්යයකි.
>
> ගො: ස: කතෘ.

ආර්. එම්. බී. කරුණාරත්න

නිමල් කුමාර නාඹර තුරුනු වියේ රසාස්වාදය ලබන රජයේ ලිපිකරුවෙකි. හේ හොඳ කඩවමින් යුතුය. නිරහංකාරය. ත්‍යාගශීලීය. කාරුණාභරිතය. ලක්දිව උසස් පන්තියෙහි ලා ගැනෙන කොළොම්පුර බෞද්ධ ඉංග්‍රීසි විද්‍යාලයයක තම අධ්‍යාපනය ලැබූ නිමල් කුඩා වියේ සිටම ඉංග්‍රීසි සිරිත් විරිත් වලට වඩා සිංහල සිරිත් විරිත් වලට ගරුකරන්ට වී. ජාතිකාභිමානයෙන් යුතුවූ හදක් ඇති තම විද්‍යාලයාධිපතිවරයාගෙන්ද නිමල්ට අන් සිසුනට වඩා ආදර සැලකිලි ලැබෙන්ට වූයේය. ඉගෙණීමෙහි දක්ෂ ශිෂ්‍යයෙකුවූ ඔහු ඉතා සුළු කාලයකදීම, තම නොපසුබට උත්සාහයේ මහඟු ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ විභාගයට පෙනී සිට එහි විශිෂ්ඨ ලෙස වැඩසාර ලන්ඩන් "මැට්‍රිකියුලේෂන්" විභාගයෙන්ද නිදහස් වෙමින් සමත් වී. සහජයෙන්ම ඉගෙණීමට හොඳ බුද්ධියක් ලබා තිබුනද, දුප්පත් දෙමව්පියන්ගේ දරුවෙකු වූ නිමල්ට දයිවයේ දුෂ්ට අණට හිස නමමින්, තමාගේ හා තම දුප්පත් මව්පියන්ගේ දෛනික ජීවනය උපයා ගනු වස් රැකියාවක් සොයනු සිත් පෙළඹින. හෙද් තම අධ්‍යාපනය තව දුරටත් දියුණු කර ගැනීමට ඔහු තුළ වූ දැඩි ආසාව තුරන් වූයේ නොවේ. රැකියාවක යෙදෙමින්ම ඉගෙණීමද කෙසේ හෝ දියුණු කර ගැනීමට තරයේ ඉටාගත්, නිමල්, රැකියා රහිත තරුණයනට අමාවක් බඳුවූ, ආණ්ඩුවේ "ගැසට්" පත්‍රය නිති බලන්නට වී.

භාග්‍යයකි, වර්ෂයක් පාසා පවත්වන රජයේ ලිපිකාරු විභාගය මේ වරද පවත්වන්ට නියමව තිබීම ඔහුගේ, මහත් ප්‍රීතියට හේතු වී. නිමල් විභාගයට පෙනී සිට දැන් මාස කීපයක් ගතවීය. දිනක් තම හිතවත් දයා උදයේම, නිමල්පායට පැමිණ ඔහුට සුභාරංචියක් දුනි. නිමල් පසුගියදා පවත්වනු ලැබූ ලිපිකාර විභාගයෙන් ප්‍රමුඛයාව සමත් වී තිබින.

මාර්තු 11 වනදා සුබ මොහොතින් තම කුඩා පැල්පතින් නිකුත් වූ නිමල් එදිනම මහනුවර කච්චේරියේ සහකාර ලිපිකාරුවෙකු වශයෙන් වැඩ භාර ගත්තේය. මේ

Spade and hoe will beat the foe!

උදැල්ලෙන් බඩගිනි සතුරා පළවා හරින්න!

නව දිවිපෙවෙත ඇරඹූ දින සිටම ඔහු හැකි තරම් පිරිමසා තම කටයුතු කරගන යෑමට බොහෝ මහන්සි ගත්තේය. මව් පියන් කෙරෙහි දැඩි ප්‍රේමයෙන් යුක්ත වූ ඔහුට උවමනා වූයේ තමා ඉතා දුක් කර දර සහිත කටුක ජීවිතයක් ගතකර හෝ තම මහලු මව්පිය දෙදෙනාට සැපවත් ජීතයක් ගත කිරීමට අවස්ථාවක් සලසා දීමටය. බොහෝ විට ඔහුට මේ නිසාම තම සහෝදර නිලධාරීන්ගේ සිත් රිදවා වැඩ කරන්ටද සිදු වූයේ මුදල් වියදම් කිරීමට ඔහු දක්වූ මැලි කම නිසා මිස වෙන අන් කරුණක් නිසා නොවේ. මාස යකට කීප වතාවක්ම පැමිණෙන උත්සව "පික්නික් පාටි" යුත මේ සියල්ලක්ම ඔහුට හිස රදය ගෙන දෙන්ට වී. තමා නැවතී සිටින බෝඩිමට රුපියල් තිහක් ගෙවන, හේ තම මාසික වියදම සඳහා රුපියල්-දහයක් හෝ පහළොහක් තබාගෙන ඉතිරි මුදල් සියල්ලම මව් පියනට යැව්වේය. මෙසේ නිමල් රක්ෂාවට යාමෙන් පසු ඒ භාග්‍යය සම්පන්න දරුවාගේ උදව්වෙන් සුරවීර දෙමහල්ලෝ සැපවත් ජීවිතයක් ගත කළහ.

"කාන්ති ඔබ දන්නවාද අර "හිල්විව්" නිවසේ නැවතී ඉන්න තරුණයා."

"හා! හා! මට දැන් තේරෙනව කාරණය. හොඳයි, යහපතක්ම වෙච්චාවෙ. මොකද ඒ තරුණයා ඔබේ හිතවතෙක් ද ?"

"නැහැ කාන්ති ඔහු මගෙ හිතවතෙක් නොවේ. නමුත් මම නම් ඔහුට හොඳටම ඇලුම් කරනවා. ඉතින් මම කොහොමද ඔහුට මගේ අදහස් කීමට "චාන්ස්" එකක් ලබා ගන්නෙ. මට ආරංචියි ඔහු "පැෂන්" කාරයෙක් නොවන බව-සිගරැට් එකක් බොන්නෙත් නැහැ-"ඩ්‍රින්ක්" එකක් ගන්නෙත් නැහැ."ඩාන්ස්" එකකට ඉඳහිටලාවත් යන්නෙත් නැහැ. ඉතින් ඔහොම මිනිහෙක් අපේ "ස්ටයිල්" වලට කැමැති වෙයිද කියලත් මට හරිම සැකයි. මම මමීටත් නිමල් ගැන කීවා-මමීත් කියනවා තරුණයා නම් හොඳයි. නමුත් මහ අමු ගොඩයා කියා".-"මොළී! ඔන්න! නිමල් උඹට ඔබින සහකාරයෙක්' මම උඹට හොඳ ගුරුකමක් කියන්නම්. ඔව් උඹ මගේ අවවාදය පිළිපැද්දොත් නිමල් උඹට අවනත වෙනවා සිකුරුමයි. නිමල් නැවතී ඉන්න "හිල්විව්" එකේ බණ්ඩාර මහතාතන් ගේ දුව කුසුමා මගේ හොඳ යාලුවෙක්- මම කුසුමාට කියා එන ඉරිදට නිමල්ව පේරාදෙනියේ මල් වත්තට එවන්නම්. අන්න එදාට නොවරදවාම එහි ගොස් නිමල්ව කොසේ හෝ කතාවට පට ලවා ගනින්."

* * *

සතිය මුලුල්ලේම වැඩ පොළෙහි යෙදී සිටින රජයේ සේවකාදීන්ට ඉරිදා දිනය විවේක දිනයකි. ඔහු මේ දිනය පැමිණෙන තෙක් හුදෙක් පුල පුලා සිටින්නේ කම ගෙවල් දොරවලට යෑමටද වෙන නොයෙක් කටයුතු කරගැනීමටද අවකාශ ලැබෙන හෙයිනි. සෑම සෙනසුරාදා දිනයකම තම මව්පියන් බැලීමට ගමට යන නිමල් මේ වර ගෙදර නොගොස් "හිල්විව්" එකේ නතර විය. කන්තෝරුවට යෑමටත් නැති හෙයින් තරමක කම්මැලි ස්වභාවයක් දැනුනු ඔහු ඇඳ පැළඳ ගෙන නගරය දෙසට එන්නට සැරසෙත්ම කුසුමා පෙර දින රාත්‍රියේ ඇයට අවශ්‍ය යැයි කියූ "ඔකිඩ්ස්'! වර්ගය ඇත්දැයි බැලීමට මල්වත්තට ගියේය.

ඒ මල්වත්ත! හා කොතරම් රමණීයද? චමත්කාර ජනකද ? ප්‍රීති ප්‍රමෝදයේ ගැලී අවට සිටින්නන් ගේ මන නුවන් පිනවමින් ඔබ මොබ සැරිසරමින් මල්වත්තේ අලංකාරත්වය වැඩිකරවන තරුණ තරුණියන් රැල දුටු තරුණ නිමල් ගේ නිස්සල සිත

Do not wait—Cultivate!

බලා නොසිටින්න- ගොවිතැන් කරන්න!

සසල වන්නට වූයේ සුළඟින් නැටවෙන ලා අඹ දල්ලක් මෙනි. දූන්, දූන්, තම ජීවිතය නව මඟකට යොමුවූ බව ඔහුට දැනෙන්ට විනි. සිත අභ්‍යන්තරයේ තට ගත් යම් ගුප්ත කාරණයකින් කැළඹුණු ඔහුගේ මුළු ශරීරයම කිලිපොලා ගිය බව ඔහුට දැනිනි. ඔහුගේ සිත මොහොතකට කැළඹුණා පමණි. හේ තම ගැමි ජීවිතය ගැන සිතුවේය. හේ තම ගැමි සමාජය ගැන සිතුවේය. හේ තම මහලු දෙම්පියන් ගැන සිතුවේය. එවිටය ඔහුට තම ප්‍රකෘති සිහිය ලැබුනේ. ඔහුගේ කැළඹුණු සිත නැවතත් ප්‍රකෘති තත්ත්වයට පැමිණියේය. හේ වට පිට බලා ශොභන කිරිගරුඬ ආසනයක වාඩිවූයේය. ඉක්බිති හේ බර කල්පනාවක යෙදුනේය. හදිසියේම පිටිපසින් තම උර හිසට යමෙකු තම හස්තයෙන් තට්ටු කරන බව දැනුන නිමල් ගැස්සී ඒ කවරෙක්දැයි බලන අටියෙන් ඒ දෙසට හැරින.

මොන පුදුමයක්ද ඔහුට තම ඇස් ඇදහිය නොහැකි විය. තමා සිහිනයක් දකින්දැයි සැක සිතූ ඔහු දෙඅතින්ම ඇස් දෙක පිසදමා තවමත් ඒ දර්ශණය ඇත්දැයි දකින අටියෙන් එදෙස බැලී. ඒ සිහිනයක් නොවන බවත්, සැබෑ දර්ශණයක් බවත්, දූන් දූන් ඔහුට මනාව වැටහින. මඳලසකින් මුව සරසා ගත් සැලෙන නාදලුවන් දෙතොලින් යුත් මේ තමා අභිමුව සිටින කාන්තාව කවරෙක්ද? ඇගේ මුව පෙදෙසින් නිකුත් වන සුගන්ධය නිමල්ව පිස්සෙක් බවට හෙළී. "ඇය මා සොසේ හඳුනයි ද? සමහර විට මේ ඇයට වැරදීමක්ද වන්ට පුලුවන. ඔව් එයා වගේ හැඩහුරුකම් ඇති නැනැත්තන් නව කොපමණ වත් ඉන්නට පුළුවන. අනේ දූන් ඇයට ඇගේ මේ හදිසි වරද තේරුම් ගිය හැටියේ කොතරම් ලජ්ජාවක් දැනේවිද? නැහැ මට ඇහැකි ඇගේ ඒ ලජ්ජාව දුරුවන ලෙස ක්‍රියා කරන්ට". කළ යුත්තේ කුමක්දැයි වටහාගත නුහුනු නිමල් බලාගත් වනම බලාහිත මේ ආදී දහසක් සිතුවිලි තම චිත්ත අභ්‍යන්තරයෙහි නංවමින්, ඒවාට නිසි පිළිතුරු තමාගෙන්ම ලබා ගැනීමට නොපොහොසත්ව, මහා වාලුකා කාන්තාරයක හසරක් නොදැන මංමුලාවූවෙකු මෙන් වික්ෂිප්තවූ ගතියකින් සිටියේය. ගතවූයේ සවල්ප වේලාවකි. පිපාසාවෙන් පෙළෙන්නෙකුට මහා දිය පාරක් පෙන්වන්නා මෙන් සමීපයෙහි වූ ඒ රූමතිය මධුර මනෝහර වූ කිංකිණි නාදයකින් ඔහු සිත් සතන් සතුටු සාගරයේ ගිල්වා දිග කතාවක් අරඹනු අටියෙන් එහි මූල පිරුවාය. "ආ නිමල් ඔබට නොහැකිද, මා අඳුනන්න– මා ඉන්නේ ඔබ නිතර දෙවේලේ යන එන රිච්මන්ඩ් පටුමාවතෙහි වූ ශ්‍රාවස්තියෙහිය. මගේ නම මොලී කලන්සූරිය. මම ඔබ ගැන හොඳටම දන්නවා– ඔබ වැඩ කරන්නේ කච්චේරියේ නොවෙද? නැවතී ඉන්නේ අර කුසුමලාගේ නිවසේ නේද? මමිත් ඔබ ගැණ හොඳටම දන්නවා– මමිගේ කිසිම විරුඬත්වයක් නැහැ මා ඔබට කතාකරනවාට" කියමින් මොලී නිමල් දෙසට ඇගේ මනසකාන්ත නෙත් සැළුම් හෙළුවාය. මීට පෙර කිසි දිනෙක තරුණියක හා කිසිම සම්බන්ධයක් නොතිබුනු නිමල් ඇගේ මේ අයස්කාන්ත බැල්මෙන් සම්පූර්ණ වෙනස් බවකට පත් වී. තරුණියකගේ බැල්මෙහි හා බසෙහි මෙතරම් රසයක් ඇති බව ඔහු කිසි දිනක දැන නොසිටියේය. ඔහුගේ සිත සැලඹුණේය. එහෙත් ඔහුගේ ආත්ම ශක්තියත් චිත්ත ධෛර්යයත් නොකැළඹුනේය. ඒ නිසාම හේ මොලීට සරදම් සිනාවක් පාවචනයෙන් දෙකොන් කාඵව කොටි කෙළේය. මොලීගේ පරම බලාපොත්තුවත්– චේතනාවත්– හිරු දුටු අඳුර මෙන් සුනු විසුනුව ගියේය. එහෙත් මෙයින් ඈ අධෛර්ය නොවූවාය. සිය බලාපොරොත්තු සුන්



නාස්ති නොකිරීමෙන් නැති බැරි කම් පිටු දකින්න!

නොකර ගත්තාය. ඈ කළේ ඔහුගෙන් ඈතුගෙතු එතැනින් ඉවත්ව යාම පමණකි.

*          *          *

ශ්‍රාවස්තියේදීය.

ප්‍රේමණීය නිමල්!

නාඳුනන අත් අකුරුවලින් ලියැවෙන මෙම ලිපිය ඇතැම්විට ඔබේ මවිතයට හේතු වනු ඇත. එබැවින් මුලින්ම මා ගැන හැඳින්වීමක් කළ යුතු යැයි සිතමි. ඊයේ අර ශෝභන මල් උයනේදී ඇති වූ සඳනුස්මරණීය සිඹිය ඔබට මතක ඇතැයි සිතමි.

නිමල්! මේ ලිපිය ඔබ අතට පත් කරන්නේ- ඊයේ ඔබට පළමුවෙන්ම කථා කිරීමට තරම් එඩිතර සිතකින් ඉදිරිපත් වූ මොලීය.

නිමල්! ඔබ මට මහත්ම ප්‍රහේලිකාවකි. ඔබට මා ඇලුම් කරනත් ඔබ මා හට ඇලුම් කරන බවක් නොපෙනේ. මහාකවි ෂේක්ස්පියරයන් කියන හැටියට මෙය ප්‍රථම දර්ශනයෙන්ම ඇතිවූ ප්‍රෙම සම්බන්ධයකැයි ඔබ පිළි නොගන්නෙහිද ?

මා විසින් ආයාසයෙන් ගොඩ නඟන ලද මේ ප්‍රෙම මන්දිරයෙහි සුරුකුමරුවා වීමට ඔබ මැලි වන්නේ මන්ද ?

නිමල්! දිවා රෑ දෙක්හිම ඔබ වෙනු වෙන් ලතවන මේ අසරණ මොලීට ඔබ පිහිට නොවන්නේ ද ?

මේ ලිපියට කරුණාකර හැකි ඉක්මනින් පිළිතුරු සපයුනු මැනවි.

මේ ඔබේ යච් දිවි,

මොලී.

සඳුදා උදේ කන්තෝරුවට ගිය නිමල්ට හා පුරා කියා තැපැල් කරුවාගෙන් ලැබුණේ කාන්තාවකගේ අත් අකුරෙන් ලියැවුණු ලිපියකි. මෙය නිමල්ගේ පුදුමයට මෙන්ම මවිතයට හේතුවක් විය. නාගරික කාන්තාවකගේ- බටහිර සිරිත් ගරු කරණ ලලනාවකගේ- මේ ක්‍රියාකලාපය නිමල්ගේ බලවත් පිළිකුලට භාජනවී. මෙහි ඉහතින් දැක්වෙනුයේ මොලී අතින් ඉංග්‍රීසියෙන් ලියැවී නිමල් අතට පත්වුනු මේ පුදුමාකාර ලිපියෙහි සිංහල අනුවාදයයි.

ගැමි ජීවිතයට ඇලුම් කරන- ගැමි තරුණයෙකු වූ නිමල් කොතරම් ඉංග්‍රීසිය දත සිටියත්- සිංහල සිරිතට- සිංහල විරිතට මෙන්ම සිංහල සංස්කෘතියටද ගරු කරන්නෙකි. ඒ නිසාම තමාට ලැබුනු මේ බලාපොත්තු රහිත ලිපියෙන් ඔහුගේ ජීවිතයේ කිසිදු වෙනසක් නොවූයේය. එහෙත් තමාට ලැබුණු ලිපියකට පිළිතුරු යැවීම ශිෂ්ට සම්ප්‍රදායකට ගරු කිරීමකැයි සිතූ නිමල් ගේ පන්හිඳ ක්‍රියා කරන්නට විය. එහි පතිඵලය තමා පහත දැක්වෙනුයේ

හිල්වේච්හිදීය.

හිතවතිය,

ඔබෙන් මොබ එවනු ලිපිය ලැබිණ. ඔබේ ලිපියෙහි වූ කදිම භාෂා විලාශයට මා ප්‍රශංසා කරණ නමුත් ඔබේ අදහස්වලට ප්‍රශංසා කිරීමට නොහැකිවීම ගැන මම කණගාටු වෙමි. මා අදහස් ඔබ හමුවේ ඍජුව ප්‍රකාශ කිරීම ගැන ඔබ උරණ නොවෙතැයි සිතමි.

මා ප්‍රහේලිකාවක් යැයි ඔබ කියන්නෙහි. ඔබට පමණක් නොව- අමරණීය සැපතක් ලබා දෙන ගැමි ජීවිතය, නුපුරුදු- නුහුරු කාහටත් මා ප්‍රහේලිකාවකි.

Dig harder for your larder!

ආහාරය සඳහා දැඩි ලෙස පොළොව කොටන්න!

ශෝභන මල් ගොමුවකදී ඇතිවූ සඳකුස් මරණීය සිඩියක් ගැන ඔබ සඳහන් කරන් නෙහි. එය ඔබට සදානුස්මරණීය සිඩියක් විය හැක. නමුත් මා එය පිළිගන්නේ අසතුටුදායක– නොහික්මුණු සිඩියක් හැටි යටයි.

ප්‍රථම දර්ශනයෙන්ම ඇතිවන ප්‍රේම ජවනිකාවක් ගැන ඔබ සඳහන් කරන් නෙහි. ඔව්! එවැන්නක් වුවද සිදුවිය යුත්තේ යම් කිසි ශිෂ්ට සම්ප්‍රදායක් පදනම් කරගෙනය.

ඔබ ඔබේ ලිපියෙන් මා සුරකුමරු වෙකු කිරීමට තැත් කරන්නෙහි. ඒ තැත ව්‍යර්ථ වී තිබේ. මන්ද ? එය සත්‍යයෙන් බොහෝ ඈත් නිසාය.

අසරණ කාන්තාවකට පිහිට වීමට අසතුටුදායි ඔබ මගෙන් පැනයක් අසන් නෙහි.

සැබෑය. අසරණ කාන්තාවකට පිහිට වීම මනසින් උසස් වූ සෑම මිනිසෙකුගේම යුතු කමකි. නමුත් ආරිය– නාරිගුණ සමුදාය පිළිකුල් කොට බටහිර පන්නයට හැදුනු වැඩුනු ඔබවැනි කාන්තාවකට පිහිට වීමට නොලැබීම ගැන කණගාටු වෙමි.

මේ කාරණය ගැන තවදුරටත් ලිවීමට මා නොවෙහෙසෙන බව ප්‍රකාශ කිරීමට ඉඩ හරිනු මැනවි. ඔබ තුළ මා පිළිබඳ යම් කිසි අදහසක් ඇතොත් ඒ සියලු අදහස් ඉවත්කර ගන්නා ලෙස හිතවතෙකු වශයෙන් අවවාද කරනු කැමැත්තෙමි.

මේ හිතවත්,
ඈන්. කේ. සූරවීර.


නිමල්ගේ තියුණු පෑන් තුඩින් ලියැවුනු මේ හරබර අදහස් ගැප්වුනු ලිපිය එදාම තැපෑලට යැවුනේය.

නිමල් පිළිබඳ සුන්වූ බලාපොරොත්තු ඇති මොලී– ට්‍යුඩර් නැමැති යුරේශියේ!නිල ධාරියෙකු සමග– මසක් යන්නටත් පෙර විවාහ ජීවිතයට ඇතුලුවූවාය. ඈ දූන් උසස් පෙළේ අය ඇසුරු කරණ– උසස් පන්තියේ වැජඹෙන– උසස්ම කාන්තාවකි.

* * *

රජ රට හිඟුරක්ගොඩ ප්‍රදේශයෙ වැසි සියලුදෙනාගේම ආදරයට පාත්‍රවුනු තරුණ උපාධිධර වැවිලිකරුවෙක් ගැන මුලු ලක් දිව අස්සක් මුල්ලක් නැර ආරංචි පැතිරෙන්ට වන. ඔහු ආණ්ඩුවේ රැකියාවක් ගැණ සිතුවෙක් නොවේ. ශාස්ත්‍රාචාර්යවර යෙක් වූ මොහු නවීන ක්‍රමානුකූලව ගොවි තැන් කිරීමෙන් ගොවිතැනෙහි ඇති උසස් කම– සුලු පඩියකට රක්ෂාවකට යෑම ඊට වඩා ශ්‍රෙෂ්ඨයයි– සිත පුහු උඩඟුවෙන් යුත් දහසක් තරුණයනට මනා ලෙස පෙන්නා දිනි. කරුණාරත්නයක් වූ මේ තරුණ ගොවියා, තම සහෝදර ගොවීයනට ද හැකි පමණ උදව් උපකාර කිරීමෙන් ඔවුන්ගේ ආර්ථික තත්ත්වය දියුණු කිරීමට බොහෝ සේ වෙර ගත්තේය. බොහෝවිට කෘෂි කර්ම දෙපාර්තමේන්තුව මගින් පවත්වන ප්‍රචාරක ක්‍රියාවන්හිදී මේ උපාධිධර ගොවියාද දක්නට ලැබින. ඔහුගෙන් දෙපාර්ත මේන්තුවටද දෙපාර්තමේන්තුවෙන් මුලු රටටද සිදුවූයේ සුලු පටු සේවයක් නොවේ.

නොබෝ කලකින් තරුණ ගොවි දූරියක් හා විවාහ වූ මොහු ගේ සැප සම් පත් පුරසඳමෙන් දිනෙන් දින වැඩෙන්ට පටන් ගනී. දයිවයාගේ අණ පරිදි ඔහු හා විවා වූ මේ පින්වත් කාන්තාවද කෘෂි කර්මය මනාසේ හැදූරූ උගත් තැනැත්තියක් වීම ඔහුගේ ජීවිතය ආලෝකයෙන් ආලෝකයට ගෙන යාමට හේතු වී. එක් නිවාඩු දිනයක විනෝද සුවය විඳිනු සඳහා පේරාදෙනියේ මල්වත්තට පැමිණ එහි වූ



ආහාර පෙරමුණ ඔබේ ගෙවත්ත වේවා!

මනෝරම්‍ය පෙදෙසක ඇති අසුනක් මත වාඩිවී සතුටු සාමීචි කතාවෙහි යෙදී සිටින මේ තරුණ යුවල හමුවට පැමිණි සිඟන් නියක්, ඇගේ කුඩා දරුවාට කෑමට යමක් ගැණීමට මුදලක් ඉල්ලන්ට වනි. සාක්කුවට අත යැවූ තරුණයා සැහෙන මුදලක් ඇය අත තැබුවාය. මඳ වේලාවක් කල්පනා සාගරයේ නිමග්නවූ **නිමල් සුරවීර** නම් ඔම්ම තරුණ උපාධිධරයාත් ඔහුගේ ප්‍රියාවත් හුනස්නෙන් නැගිට සවකීය මෝටෝ රථය කරා පා තැබුවෝය.

තම දිවි පෙවෙත ගෙන යෑම පිණිස ප්‍රකට යමක් ඉල්ලා බෝහෝ දෙනෙකුගේ ඇණුම් බැණුම්වලට ලක්වන කාලකන්නි ශමාලි මේ ත්‍යාගශීලී මහතාණන්ගෙන් ලැබුනු මුදලත් රැගෙන සිය අම්බලම කරා ගමන් කළාය. ඇගේ ඉරණම කුමක්වීද යනු විසඳීම ඔබට බාර කරමු.

එලිබිච්චිය වලව්ව
පන්තල.

# කුඹුරුවල අස්වැන්න වැඩිකරගන්නේ කෙසේද?

කුඹුරු අක්කරයකින් වැඩිපුර අස්වැන්න ලබාගැනීම සඳහා විශිෂ්ට ප්‍රතිඵල ගෙන දෙන ක්‍රම තුනක් යෙදිය හැක. ඇතැම්විට කුඹුරු අක්කරයකින් වී බුසල් 75 සිට 100 දක්වා අස්වැන්න ලබා ගැනීමට එම ක්‍රම තුන යෙදීමෙන් ඔබට හැකි වෙනවා ඇත. උසස් ප්‍රතිඵල ලබා දෙන ඒ ක්‍රම තුන මොනවාද ?

(1) **නුමුහුන් බිත්තර වී පාවිච්චි කිරීම.**
(2) **පැළ ඉන්දවීම. (Transplating)**
(3) **දැනි පෝරු පාවිච්චිය.**

යනු ඒ ක්‍රම තුනයි.

උතුරු මැද පළාතේ ඇතැම් වෙල්යායක අක්කයකට ගොමපෝර ටොන් එක බැගින් යොදා, වී වපුරා දැතිපෝරුවෙන් පෝරුගා සකස්කර ගැනීමෙන් සමහර කුඹුරුවලින් අක්කරයකට වී බුසල් 100 කට වැඩි අස්වැන්නක් ලැබෙන බව දැනගන්නට ලැබී තිබේ. අවශේෂ කුඹුරුවලින් ලැබුනේ බුසල් 40 සිට 60 දක්වා අස්වැන්නකි. කවර වෙල්යායක වුවද අස්වැන්න වැඩි කර ගැනීමට නම් අපරට ගොවි මහතුන් විසින් සිතට ගතයුතු— ක්‍රියාවෙහි යෙදියයුතු— ප්‍රධාන කරුණු තුන ඉහත දක්වා තිබේ. අවධාරණය පිණිස එය නැවතත් සඳහන් කරමු.

(1) නුමුහුන් බිත්තර වී පාවිච්චි කිරීම, 2) දැති පෝරු පාවච්චිය, (3) පැළ ඉන්දවීම—

මේ කරුණු තුණ ගැන සැළකිලිමත් වන ගොවි මහතෙකුට අස්වැන්න කපා ගන්නා කාලයේදී කිසිසේත් පසුතැවිලි වීමට සිදු නොවේ. ඒ වෙනුවට ලැබෙනුයේ ප්‍රීතියෙකි! වැඩි අස්වැන්න දැකීමෙන් ලැබෙන ඉමහත් ප්‍රීතියෙකි.

නුමුහුන් බිත්ර වී බෙදා හැරීම පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හැම උත්සාහයක්ම දරයි. මෙම බිත්තර වී නුමුහුන්ව ආරක්ෂා කරන්නේ ආණ්ඩුවේ බීජ ගබඩාවලය. පෞද්ගලික ගොවිපලවල හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළවලද නුමුහුන් බිත්තර වී බෝ කරනු ලැබේ. මේ වර්ෂයේ එවැනි බිත්තරවී ගොවිපළවල් 900 යකට ඉහළින් තිබේ. ගොවිපළවල වර්ග ප්‍රමාණයද අක්කර 600 යකින් පමණ වැඩි කර තිබේ. 1949 වර්ෂයේ දෙපාර්තමේන්තු

*Do not wait—Cultivate!*

බලා නොසිටින්න! ගොවිතැන් කරන්න!